**තලවාකැලේ - ලිඳුල නගර සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තලවාකැලේ - ලිඳුල නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ - ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවධානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වාදුන් 1.2.1 (ආ), (ඇ), (ඈ), (ඉ) දරන ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී මෙවැනි දෝෂ සිදු නොවීමට වග බලා ගනිමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැරදි හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 13 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන වාර්තා අනුව ශේෂය අතර රු.19,474,675 ක වෙනසක් විය. | අදාළ අංශවලින් නිවැරදිව ලබා ගෙන ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර ඉදිරිපත් කරමි. | නිවැරදි සංඛ්‍යා ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු වීම. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාළව එකතුව රු.3,364,914 ක් වූ ගිණුම් ශේෂයන් කාල විශ්ලේෂණ, ආදායම් උපලේඛන, ලෙජර් ගිණුම් හා ජ'නල් සටහන් නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | අදාළ අංශවලින් නිවැරදිව ලබා ගෙන ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවරදි කර ඉදිරිපත් කරමි. | උපලේඛන නිසි ලෙස නඩත්තු කළ යුතු අතර ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,982,550 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. .3,547,426 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් බදු**<br>රාජ්‍ය ආයතන 01 ක්, පෞද්ගලි ආයතන 01 කින් හා ඉහළ කොත්මලේ ජලාශය ඉදිකිරීමේදී දේපල අහිමි වූවන්ගෙන් පෙර වර්ෂවලින් අයකරගත යුතුව තිබූ, වසර 3 සිට වසර 10 දක්වා කාලයක සිට පවතින එකතුව රු. 1,237,549 ක හිඟ වරිපනම් බදු නගර සභා ආඥා පනතේ 170(1) වගන්තිය ප්‍රකාරව, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණෙන් ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය ප්‍රමාණවත් නොවුණි. | හිඟ අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. | හිඟ ආදායම් රැස්කර ගැනීමට නගර සභා නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,350,326 ක් හා මුද්දර ගාස්තු රු.1,326,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ ආදායම් පරීක්ෂක වෙත උපදෙස් ලබා දී ඇත. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 16 දක්වා කාල පරාසයක් ගතවී තිබූ, කර්මාන්ත ණයගැතියන්ගෙන්, | සභා තීරණයට අනුව ඉදිරි ගිණුම් සැකසීමේදී නිවැරදි කර ඉදිරිපත් කරමි. | ලැබිය යුතු ශේෂ අයකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | බෝට්ටු ආදායම්, විනෝද බදු හා විශ්‍රාම වැටුප් අත්තිකාරම් ලෙස ගිණුම් විෂයන් 04 ක් යටතේ අයවිය යුතු රු.1,739,497 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 17 න්, ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබා දීමට ප්‍රමාදවීම, අයිතිය තහවුරු කර ගැනීමේ ලේඛන නොමැති වීම, ගොඩනැගිලි සැලැස්මේ පවතින අඩුපාඩු හේතුවෙන් ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා දී තිබුණේ අයදුම්පත් 05 ක් සඳහා පමණි. ගොඩනැගිලි අයදුම්පත් සඳහා අනුමැතිය ලබාදීමේදී මහජන සෞඛ්‍ය නිලධාරිගේ නිර්දේශය ලබාගෙන නොතිබුණි. | ඉදිරි කටයුතු කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත යොමු කර ඇත. | කාර්යක්ෂම ලෙස කාර්යයන් ඉටුකළ යුතු වීම. |
| (ඇ) | සභා කාර්යාලය පිහිටි ස්ථානයේ ඉදිරි පස ඉහළ කොත්මලේ ජලාශය අසල, ප්‍රධාන මාර්ගය පසෙක සිදු කර ඇති අනවසර වෙළඳ කුටි 23 ක් (ලොතරැයි කුඩු 01,සභාවේ කඩ 14, සමෘද්ධි කඩ 8 ) සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාව විසින් වරින් වර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කඩ හිමියන් දැනුවත් කර ඇත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ප්‍රයෝජනයට නොගන්නා බස්නැවතුම්පළෙහි ඉහළ මාලය හා මිඩ්ල්ටන් ආහාර අලෙවි මධ්‍යස්ථානය 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.1.6 ඡේදය ප්‍රකාරව සුදුසු පාර්ශවයකට භාර දීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2021 පෙබරවාරි 12 දින වන විටත් බාහිර පාර්ශවයන්ගේ සමාජ විරෝධී ක්‍රියා සඳහා භාවිතා කරන ස්ථාන බවට පත්ව තිබුණි. | බස් නැවතුම්පොළ ඉහළ මහලේ ආපන ශාලාව බදු දීම සඳහා මෙම වසරේ ටෙන්ඩර් කැඳවුවද ඒ සඳහා කිසිදු ව්‍යාපාරිකයකු ඉදිරිපත් නොවූ බවත් ඉහළ මහල පිරිසිදු කර බාහිර පුද්ගලයන්ට ඇතුළු වීමට නොහැකි පරිදි සකස් කිරීමටත් කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතු වීම. |
| (ඉ) | කාර්මික නිලධාරිගේ වාර්තාව අනුව, නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර ගොඩනැගිලි 40 ක් හා තාවකාලික වෙළඳ කුටි 56 ක් වශයෙන් සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් 96 ක් පැවතුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ නීත්‍යානුකූල කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබීමෙන්, සභාවට විශාල ආදායමක් අහිමි වී තිබුණි. | මේ සම්බන්ධයෙන් විෂය භාර කළමනාකරණ සේවා නිලධාරී මහතා දැනුවත් කර අනවසර ඉදිකිරීම් සහ තාවකාලික ඉදිකිරීම් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරමින් පවතී. | මේ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ නීත්‍යානුකූල කිරීම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | නගර සභාවේ සේවයේ නියුතුව සිට 2019 දෙසැම්බර් 30 වන දින නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලයට ස්ථාන මාරු වී ගොස් ඇති කළමනාකරණ සේවා නිලධාරියකු විසින් භාවිතා කළ නිල නිවස ඔහු සේවයෙන් මාරු වී ගොස් වසරකුත් මාස 02 ක් පමණ ගතව තිබුණද ආපසු භාර දීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව හා 2013 අප්‍රේල් 01 දින අත්සන් කරන ලද ගිවිසුම පරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඔහුට විරුද්ධව කඩිනම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. | රජයේ නිවාස සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 පෙබරවාරි 12 වන විට වනිගසේකර සාප්පු සංකීර්ණයෙහි වූ කඩකාමර 17 ම බදුදී තිබුණු අතර විවෘත කර තිබුණු කඩ කාමර 09 න් 08 කම ව්‍යාපාරිකයින් සභාව සමඟ ගිවිසුම්ගත වූවන් නොවීය. 2021 ඔක්තෝබර් 31 දක්වා මෙම පුද්ගලයින් ඉවත් කිරීමට හෝ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ කඩ කාමර සඳහා ගිවිසුම්ගත වූ කඩ හිමියන් විසින් වෙනත් පුද්ගලයින් යොදවා ව්‍යාපාර පවත්වාගෙන යනු ලබයි. | හිඟ ආදායම් රැස්කර ගත යුතු අතර අතුරු බදු දීම් නතර කිරීමට පියවර ගත යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුකුල් මස් වෙළඳාම සඳහා ලබාදී තිබුණු අංක 04 හා 05 කඩ කාමර සතුන් මරණ ඝාතන ස්ථාන බවට පත්කරගෙන කටයුතු කරන බවත්, ඝාතනය කරන සතුන්ගේ අතුනුබහන් ඇතුළු අපද්‍රව්‍ය එම ස්ථානයේම ගොඩගසා ඇති අයුරුත් ඒ හේතුවෙන් අවට ප්‍රදේශයම දැඩි දුර්ගන්ධයෙන් යුක්තව පවතින බවත් 2021 පෙබරවාරි 09 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | පීඩාකාරි ආඥා පනත යටතේ නීති මගින් පියවර ගැනීමට සෞඛ්‍ය කමිටුවේදී තීරණය කර ඇති අතර අදාළ ස්ථානය පිරිසිදු කිරීමේ කටයුතු සිදු කර ඇත. | සතුන් ඝාතනය කිරීමේ කටයුතු මෙම ස්ථානයෙන් ඉවත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 10 ක් 2021 පෙබරවාරි 11 දින වන විටත් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ව්‍යාපාර සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර කඩිනමින් ලබා දීමට කටයුතු කරමි. | ජාතික පාරිසරික පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |